Applications.lk

Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**හක්මන ප්‍රාදේශීය සභාව**

හක්මන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවශ්‍ය සුදුසකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 01. | පුස්තකාල සහායක | 01 | (03/ 2016) රා.ප.ච.ලේ අනුව පී එල් 1/2016 රු. 24,250-10x250-10x270-10x300-12x330- රු.36410 (ඉහත සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වේ. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 කින් සමත්ව තිබිය යුතුයි. |
| 02. | ජල වැද්දුම්කරු | 01 | (03/ 2016) රා.ප.ච.ලේ අනුව පී එල් 2/2016 රු. 25250-10x270-10x300-10 x330-12x350-රු.38450 (ඉහත සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වේ. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී විෂයන් 06 කින් සමත් වීම හා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා වන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටම සමත්වීම අදාල ක්ෂෙත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

02. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

03. තෝරාගනු ලබන සේවක සේවිකාවන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

04. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසි වලට ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ හෝ රජයේ දෙපාර්තමේන්තුව හෝ හක්මණ ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

05. පත්වීම ලැබීමෙන් පසු අවුරුදු 03ක කාලයක දී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සලකා බැලේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :* මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස්කර 2017.07.07 වැනි දිනට පෙර ''ලේකම්, හක්මණ ප්‍රාදේශීය සභාව, හක්මණ.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු ය. කඩදාසියේ වම්පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍රද අසම්පූර්ණ අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

අයදුම් පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු වේ.

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතිකය,
03. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,

04. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය,
05. වසර 03කට වැඩි පළපුරුද්ද සම්බන්ධ සේවා සහතිකය,
06. මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතාව තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දැක්වේ.)
2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය හක්මණ ප්‍රදේශීය සභාවේ ලේකම් සතු වේ.

එන්.එම්.පී.ජී. අබේවික්‍රම,
ලේකම්,
හක්මණ ප්‍රාදේශීය සභාව.

2017 ජුනි මස 06 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

## හක්මණ ප්‍රාදේශීය සභාව

### ...................................... තනතුර සඳහා වූ අයදුම් පත්‍රය

01. මුලකුරු සමග නම : ........................................................................................
02. මුලකුරුවලින් හැඳින්වෙන නම : ........................................................................................
03. පෞද්ගලික ලිපිනය : ........................................................................................
04. *(අ)* උපන් දිනය : අවුරුද්ද : ..................... මාසය : ...................... දිනය : ...................
*(ආ)* 2017.07.07 දිනට වයස අවුරුදු : ..................... මාස : ...................... දින : ......................
05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? ..........................................
06. ස්ත්‍රී/ පුරුෂ භාවය : ........................................................................................
07. විවාහක/ අවිවාහක බව : ........................................................................................
08. සමත්ව ඇති ඉහළ විභාගය : ........................................................................................
09. ශිල්පීය නිපුණතා : ........................................................................................
10. වෘත්තීය සුදුසුකම් : ........................................................................................
........................................................................................
11. ඔබට උසාවියෙන් දඬුවම් පවරා තිබේ ද? : ........................................................................................
12. එසේ නම් දඬුවමේ ස්වභාවය : ............................................................................................
13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳව විස්තර : ............................................................................................
............................................................................................

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බවට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

දිනය ................................

................................
අයදුම්කරුගේ අත්සන.